WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

# පුරවැසි අධ්‍යාපනය II

※ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.

※ **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) 'ඇතැන්ස්' පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූ පුරවැසි සභාවේ කටයුතුවලට සහභාගි වීමට අවසර නොලැබූ පුද්ගලයන් **දෙකොටසක්** නම් කරන්න.

(ii) නීතියේ ආධිපත්‍යය සහිත සමාජයක දැකිය හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න.

(iii) ස්විට්සර්ලන්තයේ සන්ධීය ආණ්ඩුක්‍රමයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(iv) රටක ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න.

(v) කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා රජය සම්මත කර ඇති පනත් **දෙකක්** නම් කරන්න.

(vi) මිනිස් ක්‍රියාකාරකම් නිසා වර්තමානයේ ලෝකය මුහුණ පා සිටින පාරිසරික ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(vii) සම්පත්වල ඵලදායීතාව දියුණු කිරීමට ලෝකයේ භාවිත වන උපායමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(viii) ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන සාකච්ඡා ක්‍රමයේ මූලික ගති ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(ix) රටක සමාජ සාධාරණත්වය බිඳවැටීමට බලපාන හේතු **දෙකක්** ලියන්න.

(x) තානාපතිවරුන් හා රාජ්‍ය දූතයන් තුළ තිබිය යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

**2.** (i) ශ්‍රී ලංකාවේ මැතිවරණයක දී හෝ ජනමත විචාරණයක දී හෝ ඡන්දදායකයකු වීම සඳහා පුද්ගලයකු විසින් සපුරා තිබිය යුතු සුදුසුකම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමෙන් අත්වන ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) "ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සාර්ථක වීම කෙරෙහි ඡන්දදායකයා සතු වගකීම ඉතා වැදගත් වේ." කරුණු **තුනක්** ඇසුරෙන් මේ බව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**3.** (i) ශ්‍රී ලංකාවේ දිසා අධිකරණයට විභාග කළ හැකි නඩු වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නීතිපතිතුමාගේ කාර්යයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර, ඒවායේ ඇති වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 05 යි)

**4.** (i) ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වීමෙහිලා බලපාන සාධක **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) කිසියම් රටක් ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම තුළින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) ජාත්‍යන්තර සම්බන්ධතා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන බලපෑම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**5.** (i) මිනිසාගේ පැවැත්ම සඳහා වූ මූලික අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඕනෑම අර්ථ ක්‍රමයකට මුහුණ පෑමට සිදු වන මූලික ආර්ථික ප්‍රශ්න **තුන** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) වෙළෙඳපොළ අර්ථ ක්‍රමවල දක්නට ඇති විවිධ ස්වරූප **දෙකක්** සඳහන් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ දක්නට ඇති වෙළෙඳපොළ අර්ථක්‍රමයේ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05 යි)

**6.** (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන කෙරෙහි පුරවැසියාගෙන් ඉටු විය යුතු යුතුකම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

**7.** (i) පාරිසරික ගැටලු ඇති වීම කෙරෙහි බලපාන ස්වාභාවික සංසිද්ධි **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාව කසල කළමනාකරණයේ දී මුහුණපාන ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) මෙරට කසල කළමනාකරණය සඳහා මෑතක දී රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ කසල පිළිබඳ ගැටලුව විසඳීම සඳහා පුරවැසියන් සහාය විය යුතු ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...